THE SRI LANKA ASSOCIATION OF
GOVERNMENT MEDICAL LABORATORY TECHNOLOGISTS

Slag MLT 4291

| Hon President | Hon. General Secretary | Hon Treasurer |
| --- | --- | --- |
| Ravi Kumudesh | Sanjeewa Sirimanna | Mohomed Shafeek |
| 071 47 91 142 | 071 58 74 327 | 077 97 22 288 |
| kumudeshr@gmail.com | sirimannamail@gmail.com | nmshafeek@gmail.com |

No. 889 1/1, Maradana Road, Colombo 10. Tel : +94 773 077717 Fax : 011 - 2682134
Email : slagmlt@sltnet.lk Web : www.slagmlt.org

මගේ අංකය: SLAGMLT/Gen/2020 (38)
දිනය: 2020.06.20

වෛද්‍ය එච් එස් මුණසිංහ මහතා
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10

**<u>කෝවිඩ් 19 අණුක ජීවී රසායනාගාර අකර්මණ්‍ය කිරීමට එරෙහි වෘත්තීය ක්‍රියාමාර්ගය</u>**

මේ පිළිබඳ මගේ අංක SLAGMLT/Gen/2020 (26) දරණ 2020.05.20 දිනැති ලිපිය හා බැඳේ,

ඒ අනුව කෝවිඩ් 19 පරීක්ෂණ සිදු කෙරෙන වෛද්‍ය රසායනාගාර අණුක ජීවී වෛද්‍ය රසායනාගාර ලෙස පවත්වා ගැනීමට හැකි වන පරිදි නව වෛද්‍ය රසායනාගාර විද්‍යාඥ වෘත්තිකයන්ගේ පත්වීම් සිදු කිරීම වැලැක්වීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඇතැම් නිළධාරීන් තවදුරටත් උත්සහ කරමින් තිබෙන බව පෙන්වා දෙමි.

කෝවිඩ් 19 රසායනාගාර ස්ථාපිත කිරීමට රජය විසින් යෙදවූ මුදල් නාස්තියකින් තොරව තිරසාර ලෙස එම රසායනාගාර පවත්වා ගැනීම සඳහා සිදු කරන ලද එම ඉල්ලීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහලම නිළධාරීන් බාධා කිරීම මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය තුල එම රසායනාගාර සේවාව පවත්වා ගැනීමට ඇති අකමැත්ත පැහැදිලිව නිරීක්ෂණය කළ හැක. එම උත්සහයේ යටි අරමුණ වී ඇත්තේ එම රසායනාගාර සේවාව අකර්මණ්‍ය කොට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පිටත රසායනාගාර වෙත එකී නිදර්ශක යොමු කරවීම බව අප විශ්වාස කරමු.

මීට පෙර අවස්ථා කීපයකදීම කෝවිඩ් 19 රසායනාගාර සේවාවට එරෙහිව පවතින විවිධ බාධා කිරීම් හා අධෛර්යමත් කිරීම් පිළිබඳව ඔබතුමන් දැනුවත් කර ඇති නමුත් මාසයකට අධික කාලයක් තිස්සේ අදාල පත්වීම් සිදු කිරීමට හැකි වන ආකාරයේ විසඳුමක් ලැබී නොමැති අතර අවම වශයෙන් ඒ පිළිබඳව සාකච්ඡාමය අවස්ථාවක් හෝ අදාල පාර්ශ්වයන් විසින් ලබා දී නොමැත.

එනයින් 2020.06.25 දිනට පෙර මේ පිළිබඳව තිරසාර විසඳුමක් ලබා නොදෙන්නේ නම් වෘත්තීය ක්‍රියාමාර්ග වලට අවතීර්ණ වීමට අප සංගමයේ විධායක සභාව ඒකමතිකව තීරණය කොට ඇති බව කණගාටුවෙන් දැනුම් දෙමු. ඒ පිළිබඳ සාකච්ඡාමය විසඳුමක් තවදුරටත් අපේක්ෂා කරමු.

ස්තුතිය
මෙයට විශ්වාසී

රවී කුමුදේශ් - සභාපති
රජයේ වෛද්‍ය රසායානාගාර විද්‍යාඥ සංගමය

පිටපත්:
1. අතිගරු ජනාධිපතිතුමා
2. ජනාධිපති ලේකම්තුමා
3. ගරු සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමිය
4. අතිරේක ලේකම් (පාලන) II
5. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා
6. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා)
7. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන) III